# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2254/45 - 2021 නොවැම්බර් මස 19 වැනි සිකුරාදා - 2021.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: 4/2/1/91.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/4/2017 LO/213.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ පරවශතාවේ විස්තර* :-

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද්දෙගම ගමේ අංක 383, මැද්දෙගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද මු. පි. ගම්. 4241 හා 2021.05.18 දින දරණ පිඹුරුපතේ සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබැල්ල.

මු. පි. ගම්. 4241 - කැබලි විස්තරය

**කැබලි අංක 01**

ඉඩමේ නම: වැකෙවත්ත හෙවත් මාලිගාවත්ත; විස්තරය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිලි 2ක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 5.2444.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 පෙබරවාරි මස 09 වැනි දින පූ. භා. 10.00ට දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 පෙබරවාරි මස 02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එන්. ඒ. ඒ. එස්. නිශ්ශංකආරච්චි,**
ප්‍රාදේශීය ලේකම්,
දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2021 නොවැම්බර් මස 15 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-21

1A G 35396– 25 (2021/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*